**මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**පුරප්පාඩු**

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. රියදුරු (III ශ්‍රේණිය)**

අවශ්‍ය සුදුසුකම්

01. අ.පො.ස (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වීම.

සහ

02. මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රියදුරු පළපුරුද්දක් තිබීම .

වයස : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වෙනත් :
(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

*අයදුම්කරු විසින් මෑතකදී ලබාගත් පොලිස් වාර්තාවක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.*

වැටුප් ක්‍රමය : U-PL 3 (III) - රු. 48,005 – 16x490 – 55,845 (මාසික)
කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**02. ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය)**

අවශ්‍ය සුදුසුකම්

1 අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදි විෂයයන් හයකින් (06) සමත් වී තිබීම හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඉහත තනතුරට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2 අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්ද තිබිය යුතුය.

| | | |
|---|---|---|
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.<br><br>*අයදුම්කරු සතුව අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද G1 කාණ්ඩයේ වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.* |
| වැටුප් ක්‍රමය | : | U-PL-2 (III) - රු. 44,575-16x490-52,415 (මාසික)<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ. |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්, සහතික කරන ලද සහතිකවල පිටපත් ද සහිතව 2026.08.21 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සහකාර ලේඛකාධිකාරී/ආයතන (අනධ්‍යයන) මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් මොරටුව විශ්වවිද්‍යාලයේ https://uom.lk/vacancies වෙබ් අඩවිය මඟින් බා ගත කල හැක. ගැටළු ඇතිවුවහොත් 011- 2640511 දුරකථන අංකය අමතන්න.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව.
2026.07.30